සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 8 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02 |

නම :- ........................................................................................ විභාග අංකය :- ...........................

සැලකිය යුතුයි:

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- I හා II පිළිතුරු පත්‍ර එකට අමුණා බාර දෙන්න.

(01) අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පිළිතුර තෝරන්න.
(1) ප්‍රශංෂා (2) සියලු දෙනා
(3) උච්ඡාරණය (4) කථිකාචාර්ය

(02) මෙහි දැක්වෙන සර්ව නාම පදයක් **නොවන** පදය තෝරන්න.
(1) ගැහැනිය (2) ඔබ (3) මොවුහු (4) හේ

'ස්වකීය චරිත ශක්තියෙන් ධර්ම ඥානයෙන් හා වාග් චාතුර්යයෙන් නිසි එල ලබා ඉමහත් ශාසනික හා සමාජ මෙහෙවරෙහි නිරත වූ මේ ශ්‍රේෂ්ඨ බුද්ධ පුත්‍රයාණන් වහන්සේ සකල ලෝ වැසියන් දුක් සයුරේ ගිල්වා අපවත් වී....'

**ඉහත ඡේදය ඇසුරෙන් 3-7 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(03) ඡේදයට අනුව යෙදිය යුතු අවසාන ක්‍රියා පදය තෝරන්න.
(1) වදාළේ ය. (2) වදාරන ලදී.
(3) වදාළ සේක. (4) වදාළෙහි.

(04) මෙහි මහාප්‍රාණ අක්ෂරයක් යෙදී **නැති** වචනය තෝරන්න.
(1) ශාසනික (2) බුද්ධ (3) ශ්‍රේෂ්ඨ (4) එල

(05) මෙහි තද්ධිත නාම පදයක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) ඉමහත් (2) සකල (3) මෙහෙවර (4) ශාසනික

(06) ඡේදයේ ඇති විශේෂණ පදයක් **නොවන** පදයක් ඇති පිළිතුර කුමක් ද?
(1) චරිත, ධර්ම, ශ්‍රේෂ්ඨ (2) වාග්, ඉමහත්, සමාජ
(3) බුද්ධ, ස්වකීය, චරිත (4) මෙහෙවරක, ඉමහත්, ගිල්වා

(07) නි<u>සි</u>, <u>ශා</u>සනික, ශ්‍රේ<u>ෂ්</u>ඨ යන වචනවල ඉරි ඇඳි අක්ෂරය හඳුන්වන නාම පිළිවෙළින් යෙදී ඇති පිළිතුර තෝරන්න.
(1) තාලුජ, දන්තජ, මූර්ධජ (2) දන්තජ, තාලුජ, මූර්ධජ
(3) මූර්ධජ, දන්තජ, තාලුජ (4) දන්තජ, මූර්ධජ, තාලුජ

Department of Education - Western Province

(08) පහත දැක්වෙන පද අකාරාදි පිළිවෙළට සැකසූ විට අවසානයට යෙදෙන පදය කුමක් ද?

**ප්‍රතාපය , වික්‍රමය , වීරත්වය , ශූරතාව , කෞශල්‍යය**

(1) වීරත්වය (2) වික්‍රමය (3) ශූරතාව (4) ප්‍රතාපය

(09) මහා සිංහල ශබ්ද කෝෂයේ එන ''**කිරි පුබ්බරු**'' යන පදයේ අර්ථය කුමක් ද?

(1) කිරිබත (2) කිරි බඳුන

(3) කිරි ගොටුව (4) කිරෙන් පිසූ කොස්

(10) විධි ක්‍රියා පද පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) කියව, කියන්න, කරත්වා (2) යවු, අස , දෙනු මැනවි

(3) යන්ඩ, සිතනු, දෙම්වා (4) වැටීයන්, වෙත්වා, කියාපිය

(11) මුලින් දී ඇති පදයට සමානාර්ථයක් **නොවන** පදය තෝරන්න.

කතරගම දෙවි (1) ස්කන්ධ කුමාර (2) බරනෙත

(3) ශරවනභව (4) සුර අඳිම

(12) **ඉඩම් කඩම්** යන යුගල පද වර්ගයට අයත් පද යුගලය තෝරන්න.

(1) ලට්ටලොට්ට (2) සරුසාර

(3) අබල්බබල් (4) නහින දෙහින

(13) 'අහසට ඉනිමං බැඳීම' යන යෙදුමේ අදහසට සමාන **නොවන** පිළිතුර තෝරන්න.

(1) අඟින් කිරි දෙවීම (2) ගඟට ඉනි කැපීම

(3) කුනිස්සන්ට දල් දැමීම (4) අටුවෙන් දුමට පැනීම

(14) 'එක් කරදරයකට පත් වී සිටිය දී තවත් කරදරයක් සිදුවීම' යන අදහස දෙන ප්‍රස්තාව පිරුළ කුමක් ද?

(1) කොරේ පිටට මරේ (2) කල කල දේ පල පල දේ

(3) තැනේ හැටියට ඇණේ (4) දේසේ හැටියට වාසේ

(15) **බොහෝ කලක සිට පැවත එන** යන්නට යෙදෙන තනි පදය තෝරන්න.

(1) චිරාගත (2) චිරස්තන

(3) චිරන්තන (4) චිරංජීව

(16) ''ශිෂ්‍යයෝ මහධන සිටුපුත් <u>වත</u> ශ්‍රැතිගෝචර ශෛලියෙන් ඉදිරිපත් කළහ''. මෙහි ඉරි ඇඳි බහ්වර්ථවත් පදයේ අර්ථය කුමක් ද?

(1) මුහුණ (2) කතා පුවත

(3) වස්ත්‍රය (4) වස්තුව

- **පහත 17 - 18 වාක්‍යවල හිස්තැනට සුදුසු පිළිතුර තෝරන්න.**

(17) ආදි ශිෂ්‍යයෝ පැමිණ ............................. මුණ ගැසුණෝ ය.

(1) ගුරුවරු (2) ගුරුවරියක්

(3) ගුරුවරුන් (4) ගුරුවරයෙක්



Department of Education – Western Province

(18) රජ්ජුරුවෝ දැහැමින් රට පාලනය ................................

(1) කළේය. (2) කළහ. (3) කරන ලදී. (4) කෙරිණි.

(19) ''අත්වැඩ **පර** වැඩ සමව සිතන්නේ'' යන කවි පදයේ ඉරි ඇඳි පදයට විරුද්ධාර්ථවත් පදය තෝරන්න.

(1) අන්‍ය (2) ස්වකීය

(3) පූර්ව (4) විදේශික

(20) විකල්ප ව්‍යවහාරය දැක්වීම සඳහා යොදා ගන්නා විරාම ලක්ෂණය කුමක් ද?

(1) තිත් පෙළ (2) පෙරළි කොමාව

(3) උඩු පෙරළි කොමාව (4) වරහන

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

- **01 හා 02 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

(01) පෙළපොතේ ප්‍රායෝගික අභ්‍යාසවල ඇතුළත් වන බිත්ති පුවත්පතක් නිර්මාණය කිරීමට ඔබ කණ්ඩායමට ලැබිණි. ඒ ඇසුරෙන් පිළිතුරු සපයන්න.

(1) බිත්ති පුවත්පත නිර්මාණය කිරීමේ දී යොදා ගත් මාතෘකාව කුමක් ද? (ලකුණු 01)

(2) ඔබ නිර්මාණය කළ බිත්ති පුවත්පත ප්‍රදර්ශනය සඳහා තැබුවේ කිනම් ස්ථානයක ද? (ලකුණු 01)

(3) එය එම ස්ථානයෙහි තැබීමට ඔබ අදහස් කළේ ඇයි? (ලකුණු 02)

(3) ඔබ කණ්ඩායම බිත්ති පුවත්පතට ඉදිරිපත් කළ නිර්මාණ තුනක් ලියන්න. (ලකුණු 03)

(4) එය නිර්මාණය කිරීමට පෙර ඔබ ගුරුවරයාගෙන් අසා දැනගත් කරුණු තුනක් ලියන්න. (ලකුණු 03)

(5) ඒ සඳහා ඔබට ලැබුණු උපදෙස් තුනක් ලියන්න. (ලකුණු 03)

(7) බිත්ති පුවත්පත නිර්මාණය කිරීමෙන් ඔබට ලැබුණු ප්‍රයෝජන තුනක් ලියන්න. (ලකුණු 03)

(ලකුණු 16)

(02) පහත දැක්වෙන මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 200ක පමණ රචනාවක් ලියන්න.

(1) හස්ත කඩදාසි කර්මාන්තය පරිසර හිතකාමී දේශීය කර්මාන්තයකි.

(2) උපදේශ සාහිත්‍යය යහපත් ජීවිතයකට මඟ පෙන්වයි.

(3) රට දැය සමය උදෙසා කටයුතු කළ යතිවරයාණෝ

(4) ජනකවි විශේෂයක් වූ තේරවිලි කවි (ලකුණු 14)

(03) පෙළපොත ඇසුරෙන් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

''උදහැනැක්කේ ඉදලා මහ බඩ ගෙඩියට රා පුරව පුරවා ඉන්න එකම නේ වැඩේ''

(1) මෙසේ කීවේ කවුරුන් ද?

(2) කාහට ද?

(3) මෙම පාඨය ඇතුළත් පාඩම කුමක් ද?

(4) එම නිර්මාණය අධ්‍යක්ෂණය කළේ කවුරුන් ද?

(5) මේ සඳහා මූලාශ්‍රය කර ගත් කතාව කුමක් ද? (ලකුණු 2 × 5 = 10)

Department of Education – Western Province

(04) ළිප ගිනි මොළවන තෙක් දිය සැළියේ
සැපයක් යැයි කකුළුව දිය කෙළියේ
..................................................................................
සැපයක් නම් නැත කම් රස කෙළියේ

(1) මෙහි හිස්තැනට යෙදෙන පද්‍ය පදය ලියන්න.
(2) මෙම පද්‍ය උපුටාගත් කෘතිය නම් කරන්න.
(3) එම කෘතිය රචනා වූ යුගය නම් කරන්න.
(4) එහි කතුවරයා කවුරුන් ද?
(5) එම කතුවරයාගේ වෙනත් කෘතියක් නම් කරන්න.

(ලකුණු 2 × 5 = 10)

(05) ඩෙංගු මර්දන ව්‍යාපාරයට සමගාමීව මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාගේ සහභාගිත්වයෙන් ඔබේ පළාතේ පැවැත්වීමට සැලසුම් කර තිබෙන 'කසළ වෙළෙඳපොළ' සඳහා සුදුසු ස්ථානයක් ලබා දෙන මෙන් ඉල්ලමින් ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් වෙත යවන ලිපියක් ලියන්න. (ඔබ ගමේ සුබසාධක සංගමයේ ලේකම් යැයි සිතන්න.)

Department of Education – Western Province

(06) පහත පැදිපෙළ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කාලය පරදන පිරිසකි විරුවෝ
කොත්වල පොත්වල නම් දරුවෝ
හිරු සඳු තරු මෙන් බබළා බැබළෙති
උපන් බිමට දිවි කැප කෙරුවෝ

ඔවුනගෙ නම් ඇති ගල්කණු අබියස
නොනිමෙන පහනක් දැල්වෙන්නේ
නොමැකී ඔවුනගෙ නම් දිළිසෙනවා
පොළොව වැටෙන තුරු අපි ගුවනේ

හිරු අළුවන තුරු තරු නිවෙනා තුරු
දිස්වෙති විරුවෝ තම විමනේ
විරුවෝ විරුවෝ අප පෙර විරුවෝ
රටට දෙන්න දිවි දිවි වැරුවෝ

(1) මෙම පද්‍යවලින් කියැවෙන්නේ කවුරුන් ගැන ද?
(2) ඔවුන් හිරු සඳු මෙන් බබළන්නේ ඇයි?
(3) ඔවුන්ගේ නම් ලියැවී ඇත්තේ කොහේ ද?
(4) මෙහි දක්වෙන උපමාව හා උපමේය ලියන්න.
(5) විරුවන්ගේ නාමය කිසිදා නොදිරන බව කියැවෙන පද්‍ය පේළිය උපුටා ලියන්න.

(ලකුණු 2 × 5 = 10)

(07) පහත දැක්වෙන කෘතිවල කතුවරුන් නම් කරන්න.

(1) මානසී

(2) දොරට වැඩුම

(3) පෙත්සම

(4) ප්‍රබුද්ධ

(5) රන් කැකිර හා වෙනත් කතා

(6) වහල්ලු

(7) ලෝවැඩ සඟරාව

(8) විල්තෙර මරණය

(9) නිදහසේ දැහැන

(10) සැළලිහිණි සන්දේශය

(ලකුණු 1 × 10 = 10)

Department of Education – Western Province